මත්ස්‍ය ලෝකය

# ගෝල්ඩ්ෆිෂ් මාලුවා ගේ වත ගොත සහ ලෙඩට බේත්

මාර්ටින් ජයවර්ධන

මාලු ටැංකිය විලාසිතාවක් බවට පත්වී හමාර ය. සුළු වශයෙන් හෝ මාලු ටැංකියක් ගෙදරක තබාගන්නා තැනට එය ව්‍යාප්ත විය. සුරතල් මසුන් පිටරට යැවීමද විකිණීමද හොඳ ආදායම් මාර්ගයක් බවට පත්විය. මාලු ටැංකි නගර බදට පමණක් නොව පිටිසරටද ඉතා සීඝ්‍රලෙස ව්‍යාප්ත විය. හෘද රෝගීන් ගේ මනස පාලනය කිරීමේ උපාය මාර්ගයක් ලෙස මාලු ටැංකි නිර්දේශ කිරීම නිසා මෙය සතිපාරක්ෂක උපකරණයක තත්ත්වයට මෑතදී සිට පත්ව තිබේ. සුරතල් මසුන්ගේ මී මුත්තා හැටියට නම්දරා සිටින්නේ ගෝල්ඩ් ෆිෂ් (Gold Fish) මත්ස්‍යයා ය.

චීන ජාතිකයෝ ශතවර්ෂ ගණනාවකට ඉහත සිට ම ගෝල්ඩ් ෆිෂ් මත්ස්‍යයින් බෝකිරීමෙහි යෙදුනෝය. ජපන් ජාතිකයෝ වසර 400 ගණනකටත් එහා සිට ගෝල්ඩ් ෆිෂ් මත්ස්‍ය වර්ග පෝෂණයෙහි හා වර්ධනයෙහි පුරෝගාමී වූහ. සුරතල් මසුන් ඇතිකිරීමේ හා ව්‍යාප්ත කිරීමේ සංකල්පය යුරෝපයට ඇබ්බැහි වූයේ පෙරදිගින් ය. ඒ එක්කෝ චීනයෙනි. නැතහොත් ජපානයෙනි. කෙසේ නමුත් යුරෝපය සුරතලට මසුන් ඇති කිරීම ඇරඹුවේ මෙයින් වසර 200 කට පමණ පෙර ය. මත්ස්‍ය විලාසිතාව යුරෝපයේ ප්‍රචලිත කිරීමේ ගෞරවය හිමිවන්නේ ප්‍රංශයට ය. ප්‍රංශයේ xv ලුවී රජතුමාගේ රාජ්‍ය සමයේ රජ මාලිගයේ මෝස්තර හා විලාසිතා අංශය භාරව සිටි අධිපතිවරිය වන පොමසඩෝර් ආයතීවට ගෝල්ඩ් ෆිෂ් මත්ස්‍යයින් කීපදෙනෙක් රජ මාලිගයට අමුත්තකු වශයෙන් පැමිණි විදේශකයකුගෙන් තෑග්ගක් හැටියට ලැබුණි. පහලොස් වැනි ලුවී රජුගේ මත්ස්‍ය තටාකයේ අලංකාර මසුන් පිළිබඳ වර්ණනාව කටින් කට පැතිර ගියේ ය. සුරතල් මත්ස්‍ය රංගන තැරඹීමට පැමිණෙන ලොකු කුඩා පිරිස් වැඩි විය.

පෙර නොවූවිරූ මේ අපූර්වත්වය ප්‍රංශයටත් ප්‍රංශයෙන් අතික් යුරෝපීය රටවලටත් ගෝල්ඩ් ෆිෂ් ආනයනයට මග හෙළිකෙළේ ය.

ගෝල්ඩ් ෆිෂ් මත්ස්‍යයා ප්‍රමාණයෙන් සෙන්ටි මීටර් 4 සිට 30 දක්වා විශාලව වැඩේ. යුරෝපයේ ඉතාම ජනප්‍රිය වර්ගය බවට පත්ව ඇත්තේ සාමාන්‍ය ගෝල්ඩ් ෆිෂ් (Common gold fish) ෆෑන් ටේල් (Fan Tail) කොමට් (Comet) සහ නිම්ප් (Nimp) යන ප්‍රභේද වලට අයත් මසුන් ය. මෙයින් සාමාන්‍ය වර්ගයට ඇත්තේ සිහින් සිරුරකි. ඔවුන් ගේ වරල් ඝනය. Fan Tail වර්ගයේ සිරුර කොට ය. මහතය. වරල් සහ වලිගය දික්ව යුගල වශයෙන් පිහිටා ඇත. Comet නමින් හැඳින්වෙන වර්ගය ඇමෙරිකාවේ ඉතා විශාල ලෙස බෝකරනු ලබන වර්ගයයි. ඔවුන්ගේ සිහින් සිරුර හා නිදහස් ලෙස චලනය වන විශාල ලෙස පිහිටියාවූ බෙදී ගිය වල්ගය සුවිශේෂ කඩවසම් බවක් ඔවුන්ට ආරූඪ කරයි. Nimp වර්ගය කෙටි සිරුරින් යුක්තවන අතර කොමට් වර්ගයට මදක් සමාන නමුත් ඔවුන් ගේ ශරීරයෙහි ඇත්තේ පැතලි ස්වරූපයක් නොව වටකුරු ගතියකි.

මොවුන් බෝකළ යුත්තේ මත්ස්‍ය තටාකවල ය. කෝටි සංඛ්‍යාත ජනයා ඔවුන් නිවෙස්වල අලංකාරය සඳහාත් විනෝද කාය්‍යයක් ලෙසත් තබාගතිති. ඔබ ගෝල්ඩ් ෆිෂ් මසුන් ගැන උනන්දුව දක්වන කෙනෙක්නම් ඔවුන් නඩත්තු කරන්නේ හා ආරක්ෂා කරගන්නේ කෙසේද යන ප්‍රාථමික කරුණු හෙවත් අවබෝධයක් ලබාගත යුතු ය.

මත්ස්‍ය සෞඛ්‍යය ගැන සැලකිලිමත්වීම අත්‍යවශ්‍ය ය. රෝගී වූ විට ප්‍රතිකාර කිරීම මෙන් ම රෝග ලක්ෂණ ගැන අවබෝධයක් තිබීම බොහෝ ප්‍රයෝජනවත් ය. මත්ස්‍යයාගේ පිටුපස වරල් සහල පහතට නැඹුරුවී තිබේනම් එයින් හඳුනා ගත යුත්තේ මත්ස්‍යයා රෝගීව සිටින බව ය.



මාලු ටැංකියට යොදන පැලෑටි වර්ගවල දිලීර ද මත්ස්‍යයනට හානිදයක විය හැකිය. එබඳු දිලීර රෝගවල ප්‍රධාන ලක්ෂණය වන්නේ වරල්වල ඇතිවන දුර්වර්ණය හෝ සුදු පුල්ලි සෑදීමය.

වරල් වලින් ආරම්භවන මෙම දිලීර ලක්ෂණය ක්‍රමයෙන් වරල් වලින් ශරීරයට ව්‍යාප්ත වී ඇඟ පුරා පැතිරෙයි. එයින් පසුව කරමල්වලට පැතිර ගියවිට මත්ස්‍යයාට හුස්ම ගැනීම අපහසුවී මිය යයි.

මෙම දිලීර රෝගය හඳුනාගත් වහාම ප්‍රතිකාර කළහොත් පහසුවෙන්ම සුවකරගත හැකිය. ප්‍රථම අවස්ථාවේම ලුණු මිශ්‍ර ජලයෙන් නැවූවිට මත්ස්‍ය වරල් පහතට ගරා වැටීම සුවවෙයි.

මේ සඳහා යොදා ගතයුතු ලවණ මිශ්‍රණය ලුණු මේස හැන්දක් වතුර ගැලුමකට මිශ්‍රකොට සාදගත හැකි ය. සාමාන්‍යයෙන් මාලු ටැංකියේම පවත්නා උෂ්ණ ප්‍රමාණයට සමාන උෂ්ණත්වය ඇතිවන අන්දමට නොගැඹුරු බේසමක ලවණ මිශ්‍රණය වත්කොට සැඩ හිරුකිරණ නොවැටෙන ලෙස එළිමහනක දිනපතා විනාඩි 30 ක් පමණ කාලයක් තැබිය යුතු ය. එසේම මාලු ටැංකියද එහි ඇති සියලුම පැලෑටි සහ අනෙකුත් ද්‍රව්‍ය ද ඉවත් කොට ටැංකියත් ඒ සියල්ලත් සෝදා පොටැසියම් පර්මන්ගනේට් මිශ්‍රණය සැර බාල කොට පැය 4 ක් පමණ වේලා තිබෙන්නට හැර ටැංකිය සහ පැලෑටි ආදිය පවිත්‍ර ජලයෙන් හොඳට සෝදා හැර අලුත් වතුරෙන් ටැංකිය පුරවා දින දෙකකට හෝ තුනකට හෝ පසුව නැවත මත්ස්‍යයින් එහි දැමිය යුතු ය.

ගෝල්ඩ් ෆිෂ් මත්ස්‍යයාගේ ආදිම මී මුත්තා කාප් (Carp) මත්ස්‍යයා ය. චීනයේ සහ ජපානයේ ගංගා හා විල්ලුවල කොළ පැහැයට හුරු අළුපාට කාප් මත්ස්‍යයෝ විශාල රංචු වශයෙන් වාසය කරති. ගෝල්ඩ් ෆිෂ් ලෙස පසුව වර්ධනය වූයේ මෙම කාප් පවුලට අයත් මත්ස්‍ය විශේෂයයි.